**නිලාන් ප්‍රනාන්දු එ. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය**
RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම) 1720/2019 (2020.03.03 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** නිලාන් ප්‍රනාන්දු
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය

**පෙනීසිටීම**
අභියාචක - නිලාන් ප්‍රනාන්දු
පි.ආර්.එස්. පින්නදූව
පොදු අධිකාරිය - ජේ.සි. ගම්ලත් (DDG)
එස්.ඒ. ඉලේපෙරුම (නම් කල නිලධාරී)

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.02.27 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලීම ලැබුණු බව දැන්වීම - 2019.03.07<br>තීරණය ලබා දුන් දිනය - 2019.03.22 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.05.06 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | තොරතුරු ඉල්ලා සිටීම පිළිබඳ අභියාචනය ලද බව දැන්වීම - 2019.05.10<br>තීරණය ලබා දුන් දිනය - නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.07.10 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.02.27 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

*2019.02.19 වන දින සෞඛ්‍ය අමාත්‍යංශය මගින් පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කරන ලද්දේ ආනයනික කිරිපිටිවල කිරි මේදය හැර වෙනත් මේදයක් අඩංගු නොවන*

*බව දේශීය පරීක්ෂණාගාර වලදී හෙළිවූ බවයි. මා ඉල්ලා සිටින්නේ*

1. *එම පරීක්ෂණය පැවැත්වුයේ කවදාද?*
2. *කුමන පරීක්ෂණාගාරවලදීද?*
3. *කවුරුන් විසින්ද?*
4. *එම පරීක්ෂණයේ සම්පුර්ණ පරීක්ෂණ වාර්තාවේ පිටපතක්*

තොරතුරු නිලධාරියා 2019.03.22 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ,

*"උක්ත කරුණට අදාලව ඔබ විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ තොරතුරු නිලධාරිනිය මගින් 2019.02.27 වන දින 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබඳ පනත යටතේ 2019 පෙබරවාරි 19 වන දින සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශයේ පැවැත්වූ මාධ්‍ය සාකච්චාවේදී ප්‍රකාශ කරන ලද ආනයනික කිරි පිටි වල කිරි මේදය හැර වෙනත් මේදයක් අඩංගු නොවන බවත්, ඒ බව තහවුරු කිරීම සඳහා පරීක්ෂණ පැවැත්වූ පරීක්ෂණාගාරය කුමක්ද යන වගත් කවුරුන් විසින් සිදු කලේද යන්න හා පරීක්ෂණවල වාර්තාවන් ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.*

*ඒ අනුව මෙම ඉල්ලීම සම්බන්ධයෙන් තොරතුරු දැනග්නිමේ අයිතිවාසිකම පිලිබඳ කොමිෂන් සභාවෙන් උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කරන ලදී. කොමිෂන් සභාවෙන් උපදෙස් ලැබුණු පසුව ඔබ වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව දන්වා සිටිමි."*

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2019.05.06 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා පනත ප්‍රකාරව, නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක විසින් 2019.07.10 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය විසින් මෙහිදී පවසා සිටියේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ තොරතුරු හෙළිදරවු කිරීම ප්‍රතික්ෂේප කරන බව ය. මෙහිදී තුන්වන පාර්ශවයන් ලෙස දක්වා සිටියේ මෙම පරීක්ෂණ සිදු කල ලැබ් පරීක්ෂණාගාර සහ මෙම කිරි නිෂ්පාදනවල හිමිකරුවන් වන ෆොන්ටෙරා හා නෙස්ට්ලේ ආයතනයන් ය.

මෙහිදී කොමිෂන් සභාව විසින් අවධාරනය කල සිටියේ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනතේ 29 (2) වගන්තිය ප්‍රකාරව, එම ව්‍යාතිරේකය අදාළ වන්නේ තුන්වන පාර්ශවයක් විසින් පොදු අධිකාරිය වෙත තොරතුරු සැපයු අවස්ථාවේදී එය රහසිගත තොරතුරක් ලෙස සැලකු අවස්ථාවකදී පමණක් බව ය. එබැවින් කොමිෂන් සභාව විසින් මෙම වාර්තාව හෝ ලේඛනය රහස්‍ය බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න පොදු අධිකාරිය විසින් විමසු අතර එහිදී පොදු අධිකාරිය දක්වා සිටියේ එම වාර්තාවෙහි එහි රහසිගත බව සඳහන් බවය. මීළඟට කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් විමසා සිටියේ පොදු අධිකාරිය අදාල තුන්වන පාර්ශවයෙන් මෙම තොරතුරු හෙළිදරවු කිරීම පිලිබඳ කැමැත්ත විමසුවේද යන්න ය. එහිදී පොදු අධිකාරිය විසින් 2018.12.19 දින මෙම තුන්වන පාර්ශවයෙන් කැමැත්ත විමසු බවත් ඔවුන් එයට විරුද්ධත්ව ප්‍රකාශ කල බවත් දනවන ලදී. කෙසේ නමුදු මෙහිදී අනාවරණය වුයේ පොදු අධිකාරිය විසින් අදාල තුන්වන පාර්ශවය වෙත ලිපි යොමු කල ඇත්තේ මෙම තොරතුරු ඉල්ලීමට පෙරාතුව බව හා එහිදී ඉල්ලුම් කල ඇති තොරතුරු එකිනෙකට වෙනස් බවය.

මෙහිදී අභියාචක විසින් විමසා ඇති අනෙකුත් තොරතුරු ද අභියාචක වෙත ලබා දී නැති බව අභියාචක විසින් කොමිෂන් සභාව හමුවේ පවසන ලදී. (එම පරීක්ෂණය පැවැත්වුයේ කවදාද? කුමන පරීක්ෂණාගාරවලදීද? කවුරුන් විසින්ද?) මෙහි දී පොදු අධිකාරිය පවසා සිටියේ මෙම තොරතුරු ලබා දිය හැකි බව සහ දින 3 ක පමණ කාලයක් තුල එම තොරතුරු අභියාචක වෙත ලබා දීමට පොදු අධිකාරිය එකඟ වන ලදී.

**නියෝගය:**

අභියාචකයාගේ තොරතුරු ඉල්ලීම, තෙවන පාර්ශවයේ කැමැත්ත ඉල්ලා සිටිමින් පොදු අධිකාරිය යවන ලද 19.12.2019 ලිපියට පසුව යොමු කරන ලද්දක් බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී. තවද, පෙර තොරතුරු ඉල්ලීම අභියාචකයා විසින් දැන් ඉල්ලා ඇති තොරතුරුවලට වඩා වෙනස් කාරණයකට සම්බන්ධ

බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී. සමුළුව පොදු අධිකාරියේ ලිපියට පසු දිනට යෙදී ඇති හෙයින්, තෙවන පාර්ශවයකට ලිඛිතව නිකුත් කරන ලද දැන්වීමකින්, එවැනි හෙළිදරව් කිරීම් සඳහා *පක්ෂව හෝ විරුද්ධව* කරුණු ඉදිරිපත් කිරීමට ආරාධනා කරන ලෙසට පොදු අධිකාරියට නියම කෙරේ.

පොදු අධිකාරිය තොරතුරු දැනගැනීමේ පනතේ 5(1) (අ) හා 29 වගන්ති ප්‍රකාරව ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එම තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාලව ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය සතු වේ.

තවද, පනතේ 29(1) වන වගන්තිය මෙසේ සඳහන් කරයි;

> *"යම් පුරවැසියෙකු විසින් තොරතුරු නිලධාරියෙකුගෙන් ඉල්ලා ඇති තොරතුරු, තුන්වන පාර්ශවයකට අදාළ හෝ තුන්වන පාර්ශවයක් විසින් සපයන ලද අවස්ථාවක දී සහ එම තොරතුරු සපයනු ලබන අවස්ථාවෙදී එය රහසිගත තොරතුරක් වශයෙන් සලකනු ලැබූ අවස්ථාවක, තොරතුරු සැපයීමේ නිලධරයා විසින් එම ඉල්ලීම ලැබීමෙන් දින හතක් ඇතුලතදී, එම තොරතුරු හෙළිදරවු කිරීමට පක්ෂව හෝ විරුද්ධව එකී තුන්වන පාර්ශවය විසින් නිවේදන ලැබී දින හතක කාලයක් ඇතුළත නියෝජන ඉදිරිපත් කරන ලෙස ලිඛිත නිවේදනයක් නිකුත් කිරීම මඟින් එකී තුන්වන පාර්ශවය වෙත ආරාධනා කරනු ලැබිය යුතුය."*

කොමිෂන් සභාව තුන්වන වන පාර්ශවයක් විසින් පොදු අධිකාරියට රහසා තොරතුරු ලබා දෙන විට, එවැනි තොරතුරු හෙළිදරව් කිරීම සඳහා කැමැත්ත ලබා දීම / ප්‍රතික්ෂේප කිරීම තුන්වන වන පාර්ශවයේ වගකීම බව ත්, තවද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ විමර්ශන නිලධාරියාට මෙම තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් අභිමතය පරිදි කටයුතු කළ නොහැකි බව හා එබැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ එවැනි තොරතුරු නිදහස් කළ හැක්කේ එම තොරතුරු සම්බන්ධයෙන් මහජන උනන්දුවක් ඇත්නම් පමණක් බවත් තවදුරටත් අවධාරණය කරනු ලැබේ.

තවද, තොරතුරු අයිතම 1,2 හා 3 සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීමට පොදු අධිකාරියේ එකඟ බැවින් , සති දෙකක කාලයක් තුළ එම තොරතුරු අභියාචකයාට ලබා දෙන ලෙස පොදු අධිකාරියට නියම කරනු ලැබේ.

මීළඟ අභියාචනා විභාගය 26.05.2020 දිනට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

---

RTIC Appeal (ලේඛනගත කාර්යය පටිපාටිය) 1720/2019 (2020.07.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** නිලාන් ප්‍රනාන්දු
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**
රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

**නියෝගය:**

කෙසේවෙතත්, කොමිෂන් සභාවේ 2020.03.03 දින නියෝගය වන, පොදු අධිකාරිය එනම්, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය, තොරතුරු දැනගැනීමේ පනතතේ අයිතිවාසිකම පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ අදාල තෙවන පාර්ශවයකට ලිඛිතව නිකුත් කරන ලද දැන්වීමකින්, එවැනි හෙළිදරව් කිරීම් සඳහා පක්ෂව හෝ විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීම හා සම්බන්ධව ලිඛිත සැළකිරීම් සහ කොමිෂන් සභාවට පොදු අධිකාරිය යොමුකර නොමැති බව ත් සහ නිරීක්ෂණය විය.

තවද , අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍යය විද්‍යායාතනය විසින් නියෝජය අධ්‍යක්ෂ ජනරාල් (පාරසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා අහාර හා ආරක්ෂණ) සෞඛ්‍යය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට යවන ලද 2020.07.15 දිනැති ලිපිය සහ ඒ.එම්.කේ.කේ. අත්තනායක , අතිරේක ලේකම් (පාලන 02) ලේකම් වෙනුවට, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය විසින් නියෝජය අධ්‍යක්ෂ ජනරාල් (පාරසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය) සෞඛ්‍යය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට යවන ලද 2020.07.09 දිනැති ලිපි මගින් ද මෙම තොරතුරු ඉල්ලීමට අදාල තෙවන පාර්ශ්වයෙන් අදාල හෙළිදරව් කිරීම් සඳහා පක්ෂව හෝ විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීම හා සම්බන්ධව තොරතුරු එම ලිපි මගින් අනාවරණය නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරන ලදී.

තවද, තොරතුරු අයිතම 1, 2 හා 3 සම්බන්ධ තොරතුරු අනාවරණය කිරීමට පොදු අධිකාරියේ එකඟ වූ බැවින්, අදාල තොරතුරු අභියාචක හට ලබා දී ඇත්දැයි සනාථ කිරීමට අදාල තොරතුරු ලබා දුන් පොදු අධිකාරියේ ආවරණ ලිපිය මෙම නියෝගය ලැබී සති දෙකක කාලයක් තුළ මෙම කොමිෂන් සභාවට ලබා දෙන ලෙස පොදු අධිකාරියට නියම කරනු ලැබේ.

ඒ අනුව කොමිෂන් සභාව ලබා දුන් තීරණය සමග අනුකූලවීමට ප්‍රමාද වීමකින් තොරව හැකි ඉක්මණින් අවශ්‍ය පියවර ගන්නා ලෙස නියෝග කරනු ලැබේ. මෙම සන්නිවේදනය ලැබී සති දෙකක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරන ලෙසට නියෝග කරනු ලැබේ.

මීළඟ අභියාචනා විභාගය 2020.09.15 දිනට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනයකිරීමට ද නියෝග කරනු ලැබේ.

RTIC Appeal (ලේඛනගත කාර්යය පටිපාටිය) 1720/2019 (2020.09.15 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** නිලාන් ප්‍රනාන්දු
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**
රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට පුද්ගලික විභාග කිරීම් සඳහා කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව දින නියම කොට ඇති අභියාචනා, මුල් වාරයේ, රීති අංක 19 ප්‍රකාරව ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය සඳහා, ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරනු ලැබේ. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමකට ලක් විය හැකියි.

කොමිෂන් සභාවේ 2020.07.21 දින නියෝගයට පිළිතුරු වශයෙන් පොදු අධිකාරිය 2020.08.27 දිනැති ලිපිය කොමිෂන් සභාවට යොමු කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත කරුණු අනාවරණය විය,

*".......අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු අංක 1,2 හා 3 සම්බන්ධව මගේ අංක DDG/(E&OHFS)/06/2017 හා 2020.03.03 දිනැති ලිපිය මගින් වෛද්‍ය නිලාන් ප්‍රනාන්දු මහතා වෙත පිළිතුරු ලබා දී ඇත. එසේම තොරතුරු අංක 04 මගින් ඉල්ලා ඇති තොරතුර තුන්වන පාර්ශවයකට සම්බන්ධ තොරතුරක් වන බැවින් එයට අදාල පිළිතුරු ලිපිය අධ්‍යක්ෂ , ජාතික සෞඛ්‍යය විද්‍යාතනය, කළුතර මගින් මා වෙත ඉදිරිපත් කර තිබූ අතර එම ලිපියේ පිටපතක් 2020.07.21 වන දින තොරතුරු දැනගැනීමේ අයිතවාසිකම් පිළිබද කොමිෂන් සභාව වෙත ගෙනවිත් භාර දෙන ලදී."*

**නියෝගය:**

ඒ අනුව පොදු අධිකාරියේ 2020.08.27 දිනැති ලිපිය අනුව තොරතුරු අයිතම 1, 2 හා 3 සම්බන්ධ තොරතුරු අනාවරණය කර ඇති බව කොමිෂන් සභාව අවධාරණය කරනු ලැබේ.

තවද තොරතුරු අයිතම අංක 04 සම්බන්ධව අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍යය විද්‍යායාතනය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාරසරික සෞඛ්‍යය, වෘත්තීය සෞඛ්‍යය හා අහාර හා ආරක්ෂණ) සෞඛ්‍යය සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශයට යවන ලද 2020.07.15 දිනැති ලිපිය මගින් මෙම තොරතුරු අයිතම අංක 04 අදාලව තෙවන පාර්ශ්වයෙන් අදාල හෙළිදරව් කිරීම් සඳහා පක්ෂව හෝ විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීම හා

සම්බන්ධව තොරතුරු එම ලිපි මගින් අනාවරණය නොවන බව වන කොමිෂන් සභාවේ නිරීක්ෂණය පොදු අධිකාරියේ අවධානයට යොමු කරනු ලැබේ.

පොදු අධිකාරිය තොරතුරු දැනගැනීමේ පනතේ 5(1) (අ) හා 29 වගන්ති ප්‍රකාරව ඉල්ලා සිටින ලද තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එම ව්‍යාතිරේඛයට අදාළ බව ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය සතු වේ.

කොමිෂන් සභාව තුන්වන පාර්ශවයක් විසින් පොදු අධිකාරියට රහස්‍ය තොරතුරු ලබා දෙන විට, එවැනි තොරතුරු හෙළිදරව් කිරීම සඳහා කැමැත්ත ලබා දීම / ප්‍රතික්ෂේප කිරීම තුන්වන වන පාර්ශවයේ වගකීම බවත්, තවද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ විමර්ශන නිලධාරියාට මෙම තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තවදුරටත් අභිමතය පරිදි කටයුතු කළ නොහැකි බව හා එබැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5 (1) (අ) වගන්තිය යටතේ එවැනි තොරතුරු නිදහස් කළ හැක්කේ එම තොරතුරු අනාවරණය කිරීම මගින් මහජන සුබසිද්ධියක් සිදුවන බව තහවුරු වන්නේ නම් පමණි.

තොරතුරු අයිතම අංක 04 සම්බන්ධයෙන් පොදු අධිකාරිය එනම්, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යංශය, තොරතුරු දැනගැනීමේ පනතතේ අයිතිවාසිකම පනතේ 29 (2) (ඇ) වගන්තිය යටතේ අදාල තෙවන පාර්ශවයකට ලිඛිතව නිකුත් කරන ලද දැන්වීමකින්, එවැනි හෙළිදරව් කිරීම් සඳහා තෙවන පාර්ශවය පක්ෂව හෝ විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමට හා ඒ සම්බන්ධ ලිඛිත සැළකිරීම් මෙම සන්නිවේදනය ලැබී සති දෙකක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැන්වීමට කටයුතු කරන ලෙසට නියෝග කරනු ලැබේ.

තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් ගැඹුරින් සලකා බැලීම සඳහා මෙම අභියාචනය පුද්ගලික වශයෙන් විභාග කිරීම සඳහා 2020.11.24 දින ප.ව 12.30 ට විභාගයට ගනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ශාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
****